## මැණික්මය ගුණාංගය සහිත පළිඟු (Gem Quality Quartz) අපනයනය සඳහා වන මාර්ගෝපදේශය

1) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය ( NGJA ) විසින් මැණික්මය ගුණාංගය සහිත පළිඟු පාෂාණ රළු ස්වභාවයෙන් අපනයනය කිරීමට අනුමැතිය ලබා දී ඇත.

2) අපනයන සේවා ගාස්තුව ඉන්වොයිසියේ සඳහන් ( අවසන් මිලෙන් ) නැව් ගත වටිනාකමින් සියයට පහකි. ( FOB*05% )

3) අපනයන සේවා ගාස්තුව සඳහා VAT 18% ක් අය කරනු ලැබේ.

4) මැණික්මය ගුණාංගය සහිත පළිඟු ( Gem Quality Quartz ) අපනයනය කිරීමේදී අවම මිල ගණන්
   a. Pure Quartz Crystal – USD 30 per Kg
   b. Gem Quality Quartz – USD 15 per Kg
   c. Quartz Grade 2 Quality – USD 8 per Kg

5) Quartz Powder සහ Grit, GSMB ආයතනය හරහා අපනයනය කළ යුතුය.

6) සමාන තත්වයෙන් සමාන ගුණාංගයන් සහිත පළිඟු මැණික් පාෂාණ එක් අවස්ථාවකදී අපනයනය කරන විට එම එක සමාන මැණික් පාෂාණ වර්ග වෙන වෙනම අසුරා ඉදිරිපත් කර තිබිය යුතුය.

7) අපනයනය සඳහා ඉදිරිපත් කර ඇති ( ඉන්වොයිසියේ සඳහන් කර තිබෙන ) පළිඟු කිනම මිල ගණන් කාණ්ඩයට අයත්ද යන්න තීරණය කිරීමේ සම්පූර්ණ බලය NGJA නිලධාරීන් සතුය.

8) මෙම අපනයනය සිදුකිරීමට බලාපොරොත්තු වන අපනයනකරුට / ආයතනයට NGJA වලංගු මැණික් වෙළඳ බලපත්‍රයක් ( GDL – NGJA ) තිබිය යුතුය.

9) තවද TIN සහ VAT අංක ලබා තිබිය යුතු අතර ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ASYCUDA පද්ධතියේ රේගු නිශ්කාෂණ තොරතුරු ( Custom Declaration ) ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

10) සතියේ වැඩ දින තුල පමණක් අපනයනය සිදුකල හැකිය.

11) අපනයනකරු / ආයතනය අපනයනය සිදු කරන දිනට අවම වශයෙන් සතියකට පෙර ( වැඩ කරන දින පහ ) අපනයනයන් සිදු කරන බව ලිඛිතව NGJA දන්වා සිටිය යුතුය.

12) දිනකට පරික්ෂා කල හැක්කේ / අපනයන කල හැක්කේ අඩි 20 එක් බහාලුමක් පමණකි. (One Container Per Day)

13) පළිඟු ( Quartz ) ගෝනි වලට අසුරා තිබිය යුතු අතර, NGJA මැණික් පරික්ෂා කිරිමෙ රසායනාගාරයේ නිලධාරීන්, ශ්‍රී ලංකා රේගු නිලධාරීන්, NGJA අපනයන අංශයේ නිලධාරීන් පරික්ෂා කිරීමෙන් පසුව පමණක් කොන්ටේනරයට පැටවිය යුතුය.

14) NGJA නිලධාරින්ට හෝ හා රේගු නිලධාරීන් හට පළිඟු බහා තිබෙන ඇසුරුම් වලින් මැණික් පාෂාණ ඉවත් කර පරික්ෂා කිරිමෙ සම්පූර්ණ බලය ඇත.

15) බර සහ ගෝනි ප්‍රමාණය පැහැදිලිව දන්වා සිටිය යුතුය.

16) අපනයන ඉන්වොයිසියෙහි බර කිලෝ ග්‍රෑම් වලින් නිවැරදිව සටහන් කර තිබිය යුතුය. ( Export Invoice weight – Kg )

17) මැණික් ගුණාංග සහිත පළිඟු ( Gem Quality Quartz ) හා කාර්මික අවශ්‍යතා සඳහා යොදා ගන්නා පළිඟු ( Industrial Quality Quartz ) මිශ්‍ර කර අපනයනය කිරීම සපුරා තහනම්ය.

18) ස්ථානීය පරීක්ෂණය සිදු කර මෙම අපනයන සඳහා අවසර ලබාදෙනු ලබන කමිටුව පහත පරිදි වේ.

I. NGJA මැණික් රසායනාගාරයේ නිලධාරීන් 02
II. NGJA අපනයනය අංශයේ නිලධාරීන් 01
III. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 01

නවීන් සූරියාරච්චි
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය